කොළඹ විශ්වවිද්‍යාලය - ශාස්ත්‍ර පීඨය
ශාස්ත්‍රවේදී තෙවන වසර පරීක්ෂණය ( විශේෂ උපාධි )
පළමු සෙමෙස්තරය -2019

**SLG 3156 - සම්භාව්‍ය සිංහල පද්‍ය කාව්‍ය (ප්‍රථම තරංගය)**

(පැ දෙකයි)

ප්‍රශ්න **තුනකට (03) පමණක්** පිළිතුරු සපයන්න.

---

01. **සියබස්ලකර** දේශීය මහා කාව්‍යය සම්ප්‍රදායයක් ගොඩනගන්නට කොතෙක්දුරට බලපෑවේ දැයි ඔබ කැමති කෘති දෙකක් ඇසුරින් විමර්ශනයක යෙදෙන්න.

02. "**අපූර්ව වස්තු නිර්මානාක්ෂමා ප්‍රඥා ප්‍රතිභා**" යන ප්‍රකාශය කව්සිළුමිණ කාව්‍යය හා ගැළපෙන්නක් දැයි නිදර්ශන සහිතව පෙන්වා දෙන්න.

03. "බෞද්ධ වෘත්තාන්තයක් ඇසුරින් ප්‍රේම කාව්‍යයක් කළ **කව්සිළුමිණ** කවියා ප්‍රතිභාපූර්ණ කවියෙකි." යන්න සනිදර්ශනව විමසන්න.

04. අනුචිත වර්ණනනා කියවීමෙන් උදාසීන වූ රසිකයා මඛාදේව චරිතයේ අපූර්වත්වය වටහා ගනුයේ පසුව ය. **මුවදෙව්දාවත** ඇසුරින් විමර්ශනයක යෙදෙන්න.

05. තිරිසන් සතෙකු කථා නායකයා කර ගත් කාව්‍යයක් අලංකාරවාදයට අනුචිත ලෙස නැඹුරුවීම නිසා **සසදාවත** අසාර්ථකත්වයට පත් විය. සාකච්ඡා කරන්න.

*********************